__සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව - සති පාසල__

**01. ශ්‍රේණිය : 11 විෂයය: ගෘහ ආර්ථික විද්‍යාව සතිය : 04**

**02. පාඩම හෝ ඒකකය: 2 ගෘහිය සම්පත් කළමනාකරණය**

**03. මෙම පාඩම තුලින් ලබා ගත හැකි ඉගෙනුම් ඵල:**

- සම්පත් කළමනාකරණ ක්‍රියාවලිය විග්‍රහ කරයි.
- විවධ ගෘහිය සම්පත් පරිහරණයේදී මනා කළමනාකරණයෙහි වැදගත්කම සාකච්ඡා කරයි.
- මනා කළමනාකරණය තුලින් විවධ ගෘහිය සම්පත් ගෘහ කාර්යන්හි සාර්ථකත්වය සඳහා උපරිම ලෙස උපයෝගී කර ගනී.

04. ශිෂ්‍යයා කල යුතු කාර්යයන්:

I. ගෘහ ආර්ථික විද්‍යාව පෙළ පොතේ දෙවන පාඩම හොඳින් කියවා තේරුම් ගන්න.
II. ගෘහිය කාර්යයන් විධිමත්ව සැලසුම් කරගැනීමටත් ගෘහිය සම්පත් මනාව උපයෝගී කරගැනීමටත් නිවසේ විවිධ කාර්යයන් සඳහා කාර්ය සටහන, කාලසටහන, ශ්‍රම සටහන හා අයවැය ලේඛනය උපයෝගී කරගැනීමට නිතර උත්සහ කරන්න.
III. ඔබේ නිවසේ මසකට අදාලව ගෘහිය අයවැය ඇස්තමේන්තුවක් සකස් කරන්න. මේ සඳහා ඔබගේ නිවසේ මව/ පියා හෝ වැඩිහිටියන්ගෙන් සහය ලබා ගන්න.
IV. මෙම කළමනාකරණ මුලධර්ම භාවිතා කරමින් ඔබේ පවුලේ සාමාජිකයින් වෙනුවෙන් විශේෂ දිවා ආහාර වේලක් සකස් කිරීමට උත්සහ කරන්න.

05. ඉහත ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය තොරතුරු තව දුරටත් අධ්‍යයනය කිරීම සඳහා අන්තර්ජාලය හා සම්බන්ධ වන්න.

- https://www.youtube.com/watch?v=Aje7gNA2R9Q
- http://management-aat.blogspot.com/p/blog-page_9001.html

06. ඇගයීම / තක්සේරුකරණ ක්‍රමවේදය:

I. ගෘහ කළමනාකරණය හඳුන්වන්න. ලකුණු 05
II. කළමනාකරණ ක්‍රියාවලියේ පියවර ගෘහිය කාර්යයන් සාර්ථක කරගැනීමට යොදා ගත හැකි ආකාරය විස්තර කරන්න.

ලකුණු 10

III. ගෘහිය සම්පත් කලමනකරයේ වැදගත් කම පැහැදිලි කරන්න. ලකුණු 10